# ආගමික ගෘහනිර්මාණ පිළිබඳ අභිලේඛනමය සාක්ෂ්‍ය

(ක්‍රිස්තුපූර්ව 3වන ශතවර්ෂයේ සිට ක්‍රිස්තුවර්ෂ 4වන ශතවර්ෂය දක්වා)

ඩබ්.එම්. කල්‍යාණි විජේසුන්දර[1]

**හැඳින්වීම**

භාෂාව වනාහි හුදු තොරතුරු හුවමාරු කර ගැනීමේ සන්නිවේදන මෙවලමක් පමණක් නො වේ. වරෙක කිසියම් යුගයක සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික තත්ත්වයන්හි පිළිබිඹුවක් වන එය තවත් වරෙක සමාජයේ ඓතිහාසික තොරතුරු ප්‍රතීයමාන කරයි. සමාජ, සංස්කෘතික මෙන් ම දේශපාලන ආර්ථික යනාදී සෑම ක්ෂේත්‍රයක් කෙරෙහි ම බුදුදහමේ ආභාසය ලැබීම ලංකා සමාජයට අනන්‍ය වූ තත්ත්වයකි. බුදුදහම මෙරටට හඳුන්වා දීමට පෙර ද යම් ඇදහිලි සහ විශ්වාස පද්ධතියක් මෙරට ජනතාව අතර ව්‍යාප්තව පැවතිණි. දීර්ඝ කාලයක් තිස්සේ වෘක්ෂ වන්දනයට පුරුදු ව සිටි ඔවුන්ට හුරුපුරුදු වෘක්ෂ වන්දනය එක්වර ම ප්‍රතික්ෂේප නො කර, ඊට නව අරුතක් එකතු කිරීමට දූමින්දාගමනයෙන් අවකාශ සැලසිණි. ඒ අනුව පාරිභෝගික චෛත්‍යය වන්දනයට මිනිස්සු යොමු වූහ. මළවුන් වන්දනයට පුරුදුව සිටි මිනිසාට ඊට නව අරුතක් දෙමින් බුදු, පසේබුදු, මහරහත් ආදී උත්තමයන්ගේ පරිනිර්වාණයෙන් අනතුරු ව ධාතු නිදන් කළ චෛත්‍යයට එනම් ශාරීරික චෛත්‍යයට වැඳුම් පිදුම් කිරීමට ඉඩප්‍රස්තාව සැලසිණි. ඒ අනුව සමහර අවස්ථාවල දී ප්‍රාග් බෞද්ධ ඇදහිලිවලින් බලාපොරොත්තු වූ කාර්යයන් ඉටු කිරීම සඳහා බෞද්ධ වත්පිළිවෙත් ක්‍රම ආරම්භ කරන ලදී. භූගෝලීය වශයෙන් කුඩා රටක වුව ද විශේෂයෙන් ජනප්‍රවාද, ජනශ්‍රැති, වංශකථා මෙන් ම අභිලේඛන ද මෙවැනි තොරතුරු ගවේෂණයේ දී මහෝපකාරී වේ. ඒ අතුරින් අභිලේඛන ආශ්‍රයෙන් මෙරට ආගමික ගෘහනිර්මාණ පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමට මෙමඟින් අපේක්ෂිත ය.

**පර්යේෂණ අරමුණ**

මුල්කාලීන ශිලාලේඛනවලින් හෙළිවන සමාජීය තොරතුරු අතර ආගමික ගෘහනිර්මාණ පිළිබඳ තොරතුරු විද්‍යමාන වන ආකාරය සොයා බැලීම

**පර්යේෂණ ක්‍රමවේදය**

ප්‍රධාන වශයෙන් ම ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල ක්‍රමවේදය යොදා ගන්නා අතර, ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් *Inscription of Ceylon- Part I, Inscription of Ceylon Vol- II Part I*, Inscription of Ceylon Vol II Part II කෘති ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ඒ සම්බන්ධව රචනා වූ ප්‍රාමාණික කෘති ද යොදා ගැනේ.

---

[1]. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය. *wijesuwmk@yahoo.com*

**පර්යේෂණ ගැටලුව**

ක්‍රිස්තුපූර්ව 3වන ශතවර්ෂයේ සිට ක්‍රිස්තුවර්ෂ 4වන ශතවර්ෂය දක්වා රචිත යැයි කාලනිර්ණය කර ඇති ශිලාලේඛනවල ආගමික ගෘහනිර්මාණ පිළිබඳ තොරතුරු විද්‍යමාන වේ ද?

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

- *Inscription of Ceylon Vol. I (*Early Brahmi Inscriptions*), Inscription of Ceylon Vol- II Part I* (Late Brahmi Inscriptions) යන සෙනරත් පරණවිතාන විසින් සම්පාදිත කෘති ද්විත්වයත්, මාලනි ඩයස් විසින් සම්පාදිත Inscription of Ceylon Vol II Part II කෘතියත් ස්පර්ශ ලාංඡන පිටපත් අන්තර්ගත වීම විශේෂත්වයකි. මෙම කෘති ශිලාලේඛන පිළිබඳ අධ්‍යයනය සඳහා හමුවන වැදගත්ම මූලාශ්‍රය යි.
- නන්දදේව විජේසේකර සංස්කරණය කළ '**අභිලේඛන**' සමරු පොත්පෙළ දෙවන වෙළුම (1990) සඳහා ක්ෂේත්‍රයේ ප්‍රාමාණික වියතුන් විවිධ තේමා යටතේ ඉදිරිපත් කර ඇති ශාස්ත්‍රීය ලිපි එකතුව මඟින් සෙල්ලිපි පිළිබඳ බොහෝ තොරතුරු අධ්‍යයනය කළ හැකි ය.
- නන්දසේන මුදියන්සේ මහතාගේ '**සිංහල ශිලාලේඛන සඞ්ග්‍රහය**' මුල්කාලීන සෙල්ලිපි පිළිබඳ සිංහල භාෂාවෙන් රචනා වී ඇති කෘතියකි. එහි ඇතුළත් කරුණු සමාජීය තොරතුරු අධ්‍යයනයට බොහෝ සෙයින් වැදගත් වේ.
- සිරිමල් රණවැල්ල මහතාගේ '**සෙල්ලිපි වදන් අකාරාදිය**' ශිලාලේඛනවල දැක්වෙන වචන අරුත් ගැන්වීම සඳහා ලියැවී ඇති ප්‍රශස්තම කෘතිය යි. මෙමඟින් සෙල්ලිපිවල සඳහන් වචන පිළිබඳ නිවැරදි අදහසක් ගම්‍ය කර ගැනීමට අවකාශ සැලසෙයි.

**පර්යේෂණ සීමාව**

ක්‍රිස්තුපූර්ව යුගවල සිට ක්‍රිස්තුවර්ෂාරම්භය දක්වා රචිත සඞ්ක්ෂිප්ත සහ සරල මුල්කාලීන බ්‍රාහ්මීලිපි ආශ්‍රයෙන් හමුවන ආගමික ගෘහනිර්මාණ පිළිබඳ සාක්ෂ්‍ය හඳුනා ගනිමින් මුල්කාලීන ශිලාලේඛනවල ආගමික කරුණු බොහොමයක් අන්තර්ගත යැයි පවතින අදහස පිළිබඳ විමර්ශනයක යෙදීමට අපේක්ෂිත ය.

**පර්යේෂණ අනාවරණ**

බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී සෙල්ලිපිවලින් විවිධ ගොඩනැඟිලි වර්ග පිළිබඳ තොරතුරු අනාවරණය විය. චෛත්‍යය, සඞ්ඝාරාම, උපෝසථාඝාර, පධානඝර, නානපොකුණු, ආසනඝර, පොහොයගෙවල් සහ චේතියඝර ආදිය ඒ අතර වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රිස්තුවර්ෂ දෙවන ශතවර්ෂයට අයත් දිග්ගල විහාරයේ ගිරි ලිපියක **"දසවන පචෙක බුදහ තුබෙ"** (දහවන පසේ බුදුන් වහන්සේගේ ස්තූපය) යනුවෙන් සඳහන් වේ. එම සියවසට ම අයත් කයිකාවල ලිපියෙහි සඳහන් තොරතුරු අනුව කයිකාවල විහාරයේ චෛත්‍යයක් තිබූ බවට තොරතුරු අනාවරණය වේ. කණිට්ඨතිස්ස (ක්‍රි.ව. 165 - ක්‍රි.ව. 193) රජතුමාගේ රාජ්‍යකාලයට අයත් සිතුල්පව්ව ගිරිලිපිය ගෘහනිර්මාණ ශිල්පය ආශ්‍රිත

ව කරන අධ්‍යයනයක දී ඉතා වැදගත් වේ. එහි චෛත්‍යයෙහි ඡත්‍රයේ සහ මුද්ධවේදියෙහි ද පෝයගෙහි ද කොජරහලෙහි ද නවකම් සඳහා පූජා කළේ ය යනුවෙන් (**... නක මහරජහ චතහි චත මුදචෙතියට ච පොහොතකර දොරහි තුමහ අකඩ කොටු කරිත කොජරහලටය ච)** සඳහන් වේ. මෙහි දී හමුවන '**මුදචෙතය**' යන වචනය මුද්ධවේදිකා, මුදුන්වැට යන අරුත දීම සඳහා භාවිත වූවකි. තව ද චෛත්‍යයේ ඡත්‍රය පිළිබඳ තොරතුරු සහ පොහොයගෙය පිළිබඳ තොරතුරු ද කොජරහල යනුවෙන් විශේෂයෙන් යෙදුණ වචනයක් ද මේ ගිරි ලිපියෙන් හමු වේ. කොජරහල යනු ඇතකු පිට දරා සිටින සේ තැනූ ශාලාවක් බවට අර්ථ දැක්වෙන අතර, පරණවිතාන අරුත් සම්පාදනය කරන්නේ '**Elephant Hall**' යනුවෙනි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හබරණ වැව අසල ගල් තලාවකින් හමුවන ලිපියක "**චෙතගිරි විහරහි අබතලහි සිලචෙතහි කුමන අකඩ කොටු කරිවිත ගහවතෙහි තෙල හුත කොටු ...**" (සෑගිරි විහාරයේ අම්බස්ථලයෙහි තමා පිළිසකර කර වූ චේතියඝරයෙහි තෙල් සහ පූජාවල මිල සඳහා ...) යන පාඨයෙන් මිහින්තලේ අම්බස්ථලයෙහි ශිලාචෛත්‍යයෙහි ථූපඝරය පිළිසකර කළ බව පැවසෙයි. භාතිය රජතුමා (ක්‍රි.ව. 141- ක්‍රි.ව. 165) ගේ කාලයට අයත් මඩකලපුව නෙලුගල ගිරිලිපියෙහි "**... අහලිපවත විහරෙ පක-වට-ලබහත ච අගහට ච බොතිකරහට ච පොහොතකරහි ගහචෙතහි ච ...**" යනුවෙන් සඳහන් වේ. ඒ අනුව බොතිකර (බෝධිඝරය), පොහොතකර (උපෝසථාගාරය) සහ ගහචෙත (චෛත්‍යඝරය) පිළිබඳ තොරතුරු සඳහන් වේ. කුරුණෑගල දියබැට්ට විහාරයෙන් හමුවන ලිපියක "පුශ තෙරශ **පොශකරහෙ** ශගයෙ නියතෙ" (ඵුස්ස තෙරුන්ගේ පොහොය ගෙය සඞ්ඝයා වහන්සේට නියතය) යනුවෙන් පොහොයගෙයක් පිළිබඳ තොරතුරු හමු වේ. වසභ රජතුමා (ක්‍රි.ව.66- ක්‍රි.ව.110) විසින් කරවන ලද පෙරිමියම්කුලම් වැව සමීපයෙහි පිහිටි ගිරිලිපියක "**... නග සුදසන පතනගලහිය ...**" (නාග සුදර්ශන නම් පධානඝරයෙහි) යනුවෙන් තොරතුරු සඳහන් වේ. සෝමාවතී චෛත්‍යය අසල ඇති පුවරු ලිපියක "**... සග අරබ කරවය**" යනුවෙන් සඞ්ඝාරාමයක් කරවා ඒ වෙනුවෙන් ඉඩම් පූජා කළ බව සඳහන් වීමෙන් සෝමාවතී චෛත්‍යයෙහි සඞ්ඝාරාමය පිළිබඳ තොරතුරු අනාවරණය කරයි. මෙහි උපෝසථාගාරය පිළිබඳ ව ද තොරතුරු සඳහන් වේ. කෝන්කුඹුක්වැව ගිරිලිපියෙහි "**... සමණිවිහරහි තුමහ විරචිත පරිවණිය ජින-ජගන කොටු දිනි**" යනුවෙන් මෙහෙණවරහි තමා තැනූ පිරිවෙනෙහි ජීන ජගන සඳහා කළ පිදීමක් පිළිබඳ ව විස්තර කර ඇත. යාපහුව අසල පිහිටා ඇති හීනුක්වැව ගිරිලිපියේ නන්‍ද තෙරුන් වහන්සේගේ පිරිවෙන පිළිබඳ **(අබගිරිය-විහර (හ) වසික නක-තෙරහ පරිවනිය පහතහි දිනි)** සඳහන් වීමෙන් පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ තොරතුරු අනාවරණය වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ඔත්තප්පුව විහාරයේ ගිරි ලිපියක "**තුබහි ච ති පහ ති බොජන- හලෙ පනමළකෙ ච හොටි" Kp** 1500 (තුපයෙහි ද පහය තුනේ ද භෝජනශාලාවෙහි ද පැන් මළුවෙහි ද නඩත්තුව සඳහා කහවණු එක්දහස් පන්සියයක් පූජා කළ බව) සඳහන් වේ.

**පර්යේෂණ නිගමන**

ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳ සාක්ෂ්‍ය බොහොමයක් වංශකතාවලින් ලබා ගත හැකි වුව ද අභිලේඛනමය සාක්ෂ්‍ය අතිශය වැදගත් වන්නේ ඒවා සමකාලීන වන බැවිනි. එමෙන් ම ඉදිකිරීම් පිළිබඳ සියලු

තොරතුරු වංශකතාකරුවාගේ අවධානයට හසුවූයේ යැයි සිතීම අපහසුවීම සහ එවැනි අවස්ථා ගණනාවක් අභිලේඛනමය සාක්ෂ්‍ය විශ්ලේෂණයේ දී හමුවීම ද වැදගත් ය. පූර්ණ රාජ්‍ය අනුග්‍රහය යටතේ වූ ගෘහනිර්මාණ ශිල්පීමය ඉදිකිරීම් පිළිබඳ තොරතුරු හැරුණවිට විවිධ පුද්ගල අනුග්‍රහයන් මත සිදු කෙරී ඇති සම්පූර්ණ ඉදිකිරීම් හෝ ඒවායේ කොටස් පිළිබඳ ව තබා ඇති ශෛලමය සටහන් මඟින් ගෘහනිර්මාණ ශිල්පයේ විකාශනය මෙන් ම එහි ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු ද ගවේෂණය කළ හැකි ය. ප්‍රස්තුත යුගයේ ගෘහනිර්මාණයන්හි භාවිත වූ නව අඞ්ග ආශ්‍රිත කරුණු ද ඒවාට අදාළ කාලවකවානු ආශ්‍රිත තොරතුරු ද ගෘහනිර්මාණ ශිල්පය අරබයා සමාජ සංවිධානයේ නියෝජනය ආශ්‍රිත තොරතුරු ද පිළිබඳ සාධාරණ සාක්ෂ්‍ය විමර්ශනයක දී මෙම අභිලේඛනමය සාක්ෂ්‍ය මඟහැර යා නො හැකි ය.

**ප්‍රමුඛ පදඃ** ගෘහනිර්මාණ, චෛතියඝර, පතනගල, පධානඝර, ශිලාලේඛන

**මූලාශ්‍රය**


- Paranavitana, S. (1983). **Inscription of Ceylon** Vol. I. (Early Brahmi Inscriptions). Colombo: Department of Archaeology.
- ……… (1983). **Inscription of Ceylon** Vol- II Part I. (Late Brahmi Inscriptions). Colombo: Department of Archaeology.
- ............ (2001). **Inscription of Ceylon** Vol- II Part II. Dias, Malini (ed.). Colombo: Department of Archaeology.
- අධිකාරම්, ඊ.ඩබ්. (1963). **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය (සිංහල පරිවර්තනය).** කොළඹ.
- විජේසේකර, නන්දදේව (සංස්.). (1990). **අභිලේඛන.** සමරු පොත්පෙළ දෙවන වෙළුම. කොළඹඃ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
- අමරවංශ හිමි, කොත්මලේ (1969). **ලක්දිව සෙල්ලිපි.** කොළඹඃ එම්.ඩී. ගුණසේන සහ සමාගම.
- කරුණාරත්න, ඩබ්. එස්. (1960). **සිංහල ශිලාලේඛන.** කොළඹඃ එම්.ඩී. ගුණසේන සහ සමාගම.
- මුදියන්සේ, නන්දසේන (2000). **සිංහල ශිලාලේඛන සඞ්ග්‍රහය.** කොළඹඃ ඇස්.ගොඩගේ සහ
- සහෝදරයෝ.
- රණවැල්ල, සිරිමල් (2004). **සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය.** කොළඹඃ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
- වික්‍රමගමගේ, චන්ද්‍රා (1995). **ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැඟිලි දොරටු.** ශ්‍රී ලංකා සංස්කෘත ශ්‍රාස්තායනය.
- විමලවංශ හිමි, බද්දේගම (1959). **සෙල්ලිපි සමාජය.** කොළඹඃ අනුල මුද්‍රණාලය.
- **..........** (2000). **අපේ සංස්කෘතිය.** කොළඹඃ සමයවර්ධන ප්‍රකාශකයෝ.